සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

44 | S | I

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 11 - 2018

විභාග අංකය ....................................    **නැටුම් (දේශීය) I**    I + II පත්‍රය සඳහා කාලය පැය තුනයි

**අංක 01 - 40 දක්වා සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**නිවැරදි පිළිතුර තෝරන්න.**

1. වන්නම්වල නාමික වශයෙන් සමානතා දැකිය හැකි වන්නේ,
   I. උඩරට හා පහතරට වන්නම්වලය    II. උඩරට හා සබරගමු වන්නම්වලය
   III. පහතරට හා සබරගමු වන්නම්වලය    IV. උඩරට,පහතරට හා සබරගමු වන්නම්වලය

2. නර්තනයක සුන්දරත්වය හා ප්‍රාසාංගික බව ඇති කරන එක් ප්‍රධාන සාධකයක් ලෙස.......දැක්විය හැකි වන්නේ.
   I. දිශා හා තල ය    II. සතර අභිනය ය
   III. රටා හා මෝස්තර ය    IV. රංග රචනය ය

3. දේශීය නර්තන සම්ප්‍රදායන් අතරින් සතර අභිනය වැඩි වශයෙන් දැකිය හැකි නර්තන සම්ප්‍රදාය........... ලෙස දැක්විය හැකිය.
   I. උඩරට නර්තන සම්ප්‍රදාය    II. පහතරට නර්තන සම්ප්‍රදාය
   III. සබරගමු නර්තන සම්ප්‍රදාය    IV. ගැමි නැටුම් සම්ප්‍රදාය

4. මුහුණෙන් මතුවන භාවමය ප්‍රකාශනයක් තවත් කෙනෙකුට පහසුවෙන් තේරුම් ගත හැක්කේ ............අභිනය තුළිනි.
   I. ආංගික    II. වාචික
   III. සාත්වික    IV. ආහාර්ය

5. නළු පංචාංග යොදා ගනිමින් අවකාශය තුළ කරනු ලබන විදිමත් චලන ............. ලෙස හැඳින්වේ.
   I. නර්තනය    II. සරඹ
   III. රඟපෑම    IV. ව්‍යායාම

6. අවකාශය තුළ චලන හැසිරවීමේදී දිශා හා තල ගණන පිළිවෙලින් ............ කි.
   I. දිශා 10 කි තල 03    II. දිශා 03 කි තල 10
   III. දිශා 08 කි තල 03    IV. දිශා 04 කි තල 02

7. ලය ප්‍රභේද අනුව කරන නර්තනයක දී ඉතා වැඩිම වේගය ..........ලෙස හැඳින්වේ.
   I. විලම්භ ලය    II. ද්‍රැත ලය
   III. අති ද්‍රැත ලය    IV. මධ්‍ය ලය

8. තාල තැබීමේදී තාලස්ථානය දැක්වීම .........නමින් හඳුන්වනු ලැබේ.
   I. ආතත    II. විතත
   III. අනාඝාත    IV. ආඝාත

9 බෙරපද හෝ කවි පද නිවැරදිව අදාල තාලයට අනුව ලියා දැක්වීම......යි.
   I. වාර්තාකරණය    II. ප්‍රශ්නකරණය
   III. ප්‍රස්ථාරකරණය    IV. ප්‍රකාශකරණය

10. වෙස් අත්ත භාවිතා කරන නාටකය වන්නේ ......ය.
   I. සොකරි නාටකය    II. කෝලම් නාටකය
   III. නූර්ති නාටකය    IV. නාඩගම් නාටකය

11. දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි පුරාවෘත්ත කථා ප්‍රවෘත්තීන් බොහෝ විට ගොඩනැගී ඇත්තේ...........
   I. දෙවියන් හා බමුණන් සම්බන්ධවය    II. දෙවියන් හා රජවරුන් සම්බන්ධවය
   III. දෙවියන් යකුන් සහ සතුන් සම්බන්ධවය    IV. රජුන් හා බමුණන් සම්බන්ධවය

12. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල ප්‍රචලිත ගැමි නාටක වශයෙන් හැඳින්වෙන්නේ ............ ය.

I. රූකඩ, මහඹබා, කෝලම     II. කෝලම් රූකඩ නාඩගම්

III. දිග්ගෙය, සොකරි, රූකඩ     IV. සොකරි, කෝලම්, තෙරුක්කූත්තු

13 පැරණි ලී කෙලි නර්තනයක රූකම් දැකිය හැකි ස්ථානයක් වන්නේ

I. ගඩලාදෙනිය විහාරයේ ගල්කණුමතය

II. ඇම්බැක්කේ දේවාලයේ ලී බාල්කයකය

III. බෙන්තර ගලපාත විහාරයේ උළුවස්සකය

IV. යාපහුව මාලිගයේ පියගැටපෙළකය

14 කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරනු ලබන නර්තන අංගයක් නිර්මාණය කිරීමේදී සැලකිය යුතු කරුණක් නම්

I. එකම උස ඇති පිරිසක් තෝරා ගැනීමය

II. ගැමි නැටුම් අංග වැඩි වශයෙන් යොදා ගැනීමය

III. බෙරය නිසි අයුරින් වාදනය කිරීමය

IV. අවකාශය මැනවින් භාවිතා කිරීමය

15 ප්‍රේමකුමාර එපිටවෙල සහ චිත්‍රසේන යන ශිල්පීන් විසින් නිෂ්පාදනය කරනු ලැබූ මුද්‍රා නාට්‍ය දෙකක් ලෙස දැක්විය හැක්කේ .........ය.

I. පරවිය සහ සෙබලිය     II. සැළලිහිණිය සහ කරදිය

III. සත්පත්තිනි සහ චණ්ඩාලිකාය     IV. පරෙවිය සහ සැළලිහිණියෙ

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | සිම්බල් | හක්ගෙඩිය | තම්මැට්ටම | මද්දලය |
| 2 | පන්තේරුව | බටනලාව | ගැටබෙරය | උඩැක්කිය |
| 3 | තලිය | කොම්බුව | පහතරට බෙරය | මෘදංගය |
| 4 | තාලම්පට | හොරණෑව | දවුල | රබාන |

16. ඉහත වගුව අනුව ඝන වාද්‍ය භාණ්ඩ ඇතුලත් තීරුව වන්නේ,

I. A තීරුව     II. B තීරුව

III. C තීරුව     IV. D තීරුව

17. සුසිර ගණයට අයත් භාණ්ඩ දැකිය හැක්කේ,

I. B තීරුවේය     II. A තීරුවේය

III. C තීරුවේය     IV. D තීරුවේය

18 . දේශීය නර්තනය සඳහා වාදනය කරනු ලබන අවනද්ද භාණ්ඩ දක්නට ඇත්තේ,

I. A සහ B තීරුවලය.     II. C සහ D තීරුවලය.

III. A සහ C තීරුවලය.     IV. B සහ D තීරුවලය.

19. "ගුරුහාමි හා මුදලි" චරිත හමු වන්නේ,

I. කිඳුරු හා මනමේ නාට්‍යවලදීය.     II. සොකරි හා සිංහබාහු නාට්‍යවලදීය.

III. කෝලම් හා සිංහබාහු නාට්‍යවලදීය.     IV. සොකරි සහ කෝලම් නාට්‍යවලදීය.

20. මුද්‍රා නාට්‍යවල ආවේණික ලක්ෂණයක් වන්නේ,

I. ගායනය හා සංගීතයට අනුව නාට්‍ය ඉදිරිපත් කිරීමය.

II. ගායනය කරමින් වාදනයට අනුව නාට්‍ය ඉදිරිපත් කිරීමය

III. සතර අභිනයම උපයෝගී කර ගනිමින් නාට්‍ය ඉදිරිපත් කිරීමය.

IV. පසුබිම් ගායනය හා සංගීතයට අනුව නර්තනය යොදා ගනිමින් අදහස් ප්‍රකාශ කිරීමය.

21. 1940 ගණන්වල භාරතයට ගොස් නර්තන කලාව හැදෑරූ ශ්‍රී ලාංකික ශිල්පීන් වන්නේ,
I. ශේෂා පලිහක්කාර මහතා හා සෝමබන්දු විද්‍යාපති මහතාය.
II. චිත්‍රසේන මහතා හා පනීභාරත මහතාය.
III. වසන්ත කුමාර මහතා හා ලයනල් එදිරිසිංහ මහතාය.
IV. ගංගානාථ මහතා හා රුක්මණී දේවි මහත්මිය.

22. සෞන්දර්ය විෂයන් පිළිබඳව රසවින්දනය හා නිර්මාණ කුසලතා දියුනු කර ගැනීම සඳහා
I. එළිමහන් වේදිකාවල පැවැත්වෙන නර්තන, ගායන හා වාදන නැරඹීම කළ යුතු ය.
II. රූපවාහිනයේ දක්නට ලැබෙන විවිධ රටවල නර්තන, ගායන වාදන හා නාට්‍ය නැරඹීම වැදගත්ය.
III. පුවත්පත් සඟරා ආදියේ දැක්වෙන චිත්‍ර නර්තන හා සංගීතය පිළිබඳ තොරතුරු කියවීම ප්‍රයෝජනවත් ය.
IV. පරිසරයේ දක්නට ලැබෙන නර්තන සංගීත චිත්‍ර හා නාට්‍ය සම්බන්ධ කලාකෘති ඇසුරු කිරීම හා අධ්‍යනය කිරීම ප්‍රයෝජනවත් ය.

23. දොං ජිංත ගත දොංත සහ කුද ගත ගත දොං බෙර පදය අයත් වන්නේ,
I. මාත්‍රා 2 + 3 දෙතිතට සහ මාත්‍රා 2 + 2 + 3 තුන්තිතටය.
II. මාත්‍රා 2 + 4 දෙතිතට සහ මාත්‍රා 2 + 2 + 3 තුන්තිතටය.
III. මාත්‍රා 2 + 3 දෙතිතට සහ මාත්‍රා 2 + 2 + 4 තුන්තිතටය.
IV. මාත්‍රා 2 + 4 දෙතිතට සහ මාත්‍රා 2 + 2 + 4 තුන්තිතටය.

24. චරිත සඳහා නර්තන නිර්මාණයේදී වැඩි වශයෙන් අවධානය යොමු කළ යුත්තේ,
I. ආංගික අභිනය සහ සාත්වික අභිනය කෙරෙහිය
II. වාචික අභිනය සහ ආහාර්ය අභිනය කෙරෙහිය.
III. ආංගික අභිනය සහ වාචික අභිනය කෙරෙහිය.
IV. සාත්වික අභිනය සහ ආහාර්ය අභිනය කෙරෙහිය.

25. ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් නම්,
I. තාලානුකූල චලන සහ ප්‍රකාශනාත්මක චලන II. තාලානුකූල චලන සහමුද්‍රා භාවිතය
III. රිද්මයානුකූල චලන සහ සාම්ප්‍රදායික නර්තන IV. ප්‍රකාශනාත්මක චලන සහ අභිචලන



ප්‍රශ්න අංක 26 සිට 28 තෙක් ප්‍රශ්නවලට ඉහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.

26. රූප සටහන් අනුව රංග වස්ත්‍රාභරණ අනුපිළිවෙලින් දැක්වෙන්නේ කුමන නර්තන සම්ප්‍රදායන්ගේද ?
I. පහතරට, උඩරට සහ සබරගමු II. සබරගමු, උඩරට සහ පහතරට
III. තෙල්මෙ, උඩරට සහ සබරගමු IV. සබරගමු, උඩරට සහ තෙල්මෙ

27. කාගුල් තොප්පිය සහ ජටාපටිය අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් දැක්වෙන්නේ කිනම් අංකවලින්ද?
I. අංක 03 සහ අංක 02 II. අංක 03 සහ අංක 01
III. අංක 01 සහ අංක 03 IV. අංක 01 සහ අංක 02

28 . පබළු හැට්ටය සහ අවුල්හැරය අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් දැක්වෙන්නේ කිනම් අංක වලින්ද?
I. අංක 02 සහ අංක 03
II. අංක 01 සහ අංක 03
III. අංක 03 සහ අංක 02
IV. අංක 01 සහ අංක 02

29. සැව්ලා වන්නම ගායනය හා වාදනය කළ යුත්තේ
I. සුළු මැදුම් දෙතිතටය II. සුළු මහ දෙතිතටය
III. දෙසුළු මැදුම් තුන්තිතටය IV. දෙමැදුම් මහ දෙතිතටය

30. දොලොස් වන ගොඩ සරඹය හඳුන්වන සරඹ නාමය වන්නේ,
I. බඹර සරඹය ය. II. චන්ද්‍රිකා සරඹය ය.
III. දෑත පැගීමේ සරඹය ය. IV. අර්ධ චක්‍ර සරඹය ය.

31. තිත වාදනයට පසුව ගායනය ආරම්භ වීම හඳුන්වන්නේ,
- I. සමග්‍රහ ලෙසය.
- II. නවග්‍රහ ලෙසය.
- III. අවග්‍රහ ලෙසය.
- IV. විෂමග්‍රහ ලෙසය.

32. උඩරට නර්තන සම්ප්‍රදාය සඳහා භාවිතා කරන වාද්‍ය භාණ්ඩ මේවායින් තෝරන්න.
- I. ගැටබෙරය, තාලම්පට, පන්තේරුව, උඩැක්කිය
- II. ගැටබෙරය, පන්තේරුව, දඬුබෙරය, තාලම්පට
- III. ගැටබෙරය, දිග්බෙරය, උඩැක්කිය, පන්තේරුව
- IV. ගැටබෙරය, තාලම්පට, බුම්මැඩිය, උඩැක්කිය

33. කොහොඹාකංකාරි ශාන්ති කර්මයේ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා ඇතුළත් වරණය තෝරන්න.
- I. කතා පහ සහ යක්කම්
- II. මුවමල විදීම සහ මහායාතිකාව
- III. ගුරුගේමාලාව සහ යක්කම්
- IV. ගුරුගේමාලාව සහ මඩුපුරය

34. උඩරට වන්නමක කස්තිරම නර්තනය කිරීමෙන් අපේක්ෂා කරනුයේ,
- I. අඩව්ව නම් වූ නර්තන අංගයට මූලික සූදානම් වීමක් වශයෙනි
- II. එකම තාලයකට පදයක් හෝ පද කීපයක් නර්තනය කිරීමය.
- III. සීරුමාරුව නර්තනය කිරීමට පෙරහුරුවක් වශයෙනි.
- IV. එකම තාලයකට අනුව පදයක් හෝ පද කීපයක් නටා උච්ච අවස්ථාවකට ගෙනවිත් අවසන් කිරීමය.

35. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ කොහොඹා දෙවියන්ට අමතරව පුද ලබන්නේ,
- I. රුප්පා යකුන් සහ විෂ්ණු දෙවියන්ය.
- II. අඹරාපති සහ නාථ දෙවියන්ය.
- III. බණ්ඩාර දෙවිවරු සහ වැදියකුන්ය.
- IV. වීරමුණ්ඩ සහ කතරගම දෙවියන්ය.

36. මෙම කස්තිරමේ හිස්තැනට අයත් පද කොටස තෝරන්න.

ජිකුතක තරිකිට කුංදත් .............................. කුංදත් .................. තරිකිට කුංදත් තා.

- I. කුද ගජිගත, තකුතක
- II. ගජිංත ගජ්ජිත්, තකුතක
- III. රුංජිංගත්තත්, රුංතක
- IV. ගත්තකුදං, ගතකුං

37. කතකලි නර්තන සම්ප්‍රදාය ප්‍රභවය ලද ප්‍රදේශ වන්නේ,

- I. උත්තරභාරතයේ මලභාරය ප්‍රදේශයයි.
- II. දක්ෂිණ භාරතයේ කේරළ ප්‍රදේශයයි.
- III. උත්තර භාරතයේ කේරළ ප්‍රදේශයයි.
- IV. දක්ෂිණ භාරතයේ මදුරාසි ප්‍රදේශයයි.

38. කතකලි නර්තන සම්ප්‍රදාය සඳහා යොදා ගන්නා සංගීත සම්ප්‍රදාය හා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
- I. දක්ෂිණ භාරතීය සංගීතය හා චෙන්ඩාවය
- II. උත්තරභාරතීය සංගීතය හා පුං බෙරය
- III. දක්ෂිණ භාරතීය කර්ණාට සංගීතය හා චෙන්ඩාවය
- IV. උත්තර භාරතීය කර්ණාට සංගීතය හා පුං ඩෝල්කිය

39. ශාස්ත්‍රීය නර්තනයකින් ගැමි නර්තනයක් වෙන්කොට හඳුනාගත හැකි වන්නේ,
- I. උපකරණ සහිතව කණ්ඩායමක් වශයෙන් නර්තනය කිරීමෙනි.
- II. ගායනය හා උපකරණ භාවිතයෙනි.
- III. සරල බවින් යුතුව ගායනය සහිතව නර්තනය කිරීමෙනි.
- IV. සරල බවින් යුතුව නර්තනය කිරීමෙනි.

40. ග්‍රීක නාට්‍යයක් ඇසුරින් බන්දුල ජයවර්ධන ශූරීන් විසින් නිර්මාණය කළ නාට්‍යයක් ලෙස නම් කළ හැකිය.
- I. මනමේ නාට්‍යය
- II. බෙරහඬ නාට්‍යය
- III. විදුර නාට්‍යය
- IV. නරිබෑනා නාට්‍යය

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

44 S I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය ..................................... නැටුම් (දේශීය) II කාලය පැය දෙකයි

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

II කොටස

1. I. ලී කැටයමින් කළ නලඟනකගේ රූපයක් ..........................................................දේවාලයෙන් සොයාගත හැකිය.

II. ද්‍රවිඩ ගැමි නර්තනයක් වන ..................................................නර්තනය දේශීය ගැමි නර්තනවල කළගෙඩි නර්තනයට සමාන වේ.

III. නවග්‍රහයින් මුල් කොටගෙන.............................................කවි ගායනා කෙරේ.

IV. තම්මැට්ටම සඳහා .......................................බෙරය යන නාමය භාවිතා කෙරේ.

V. චිත්‍රසේන මහතා විසින් කරදිය මුද්‍රා නාට්‍යයේ මන්නඩිරාලගේ චරිතය සහ ...................... චරිතය රඟ දක්වන ලදී.

VI. ගොයම් කැපීමේ නර්තනය වේදිකාව සඳහා නිර්මාණය කරන ලද්දේ ............................... .................................................... මහතා විසිනි.

VII. පාසල්තුල නර්තන විෂය ඉල්වීම ආරම්භ වූයේ ....................................................වර්ෂයේදීය.

VIII. සොකරි ගැමි නාටකයේ සියළුම චරිත රඟ දක්වනු ලබන්නේ ........................................... විසිනි.

IX. කථකලි නර්තනයේ ප්‍රධාන ගායකයා ..............................................................වන අතර ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ..................................................වේ.

X. උඩරට වන්නම් ................................................ යේ රචනා වී අතර පහතරට වත්නම් රචනා වී ඇත්තේ .................................................. ය,

(ළ.12)

2. I. මාත්‍රා 3+4 දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.
(ළ.02)

II. මාත්‍රා 4+4 තනිතිතට අයත් වන්නමක කවි පදයක් ප්‍රස්ථාර කරන්න.
(ළ.04)

III. මාත්‍රා 2+3 දෙතිතට අයත් වන්නමක අඩව්ව ප්‍රස්ථාර කරන්න.
(ළ.06)

3. දේශීය ශාන්තිකර්මවල පුදපූජා වෙන් වෙන්ව ඉටු කරන ලද ආකෘතියේ සමානතා පවතී.

I. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ හා දෙවොල්මඩු ශාන්තිකර්මයේ සමානතා දක්වන චාරිත්‍ර විධි 02 ක් නම් කරන්න.
(ළ.02)

II. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ එන ගායනා සහිත නර්තන අංග 02 ක් කෙටියෙන් හඳුන්වන්න.
(ළ.04)

III. දෙවොල්මඩු ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාලි දෙකක් නම් කර එකක් පිළිබඳව විස්තර කරන්න.
(ළ.06)

4. I. මහනුවර යුගයේ ලංකාවට පැමිණි දේශාටන වාර්තාකරුවන් දෙදෙනෙක් නම් කරන්න.
(ළ.02)

II. එයින් එක් දේශාටන වාර්තාවක අඩංගු තරුණක් සඳහන් කරන්න. (ළ.04)

III. මෙම දේශාටන වාර්තා ඇසුරින් එම යුගයේ පැවති නර්තන කලාව පිළිබඳව විමසීමක් කරන්න.
(ළ.06)

5. I. ආහාර්ය අභිනය අතින් පොහොසත් භාරතීය නර්තන සම්ප්‍රදායක් නම් කර එහි වේෂනිරූපනය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ල.04)

II. කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ කථා පුවත කෙටියෙන් ලියන්න.

(ල.04)

III. දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමසීමක් කරන්න.

(ල.04)

6. පහත සඳහන් මාතෘකා අතරින් 03 ක් පිළිබඳ කෙටි සටහනක ලියන්න.

1. අංගරචනය
2. ප්‍රස්තාරකරණය
3. අවනද්ධ භාණ්ඩ
4. පංචතූර්ය වාදනය
5. වට්ටම්
6. ශාන්තිකර්ම

(ල.4x3=12)

7. විද්‍යුත් මාධ්‍යයක් ලෙස රූපවාහිනි මාධ්‍ය නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා ඉහළ දනායකත්වයක් සපයයි.

01. ඔබ නැරඹූ රූපවාහිනී වැඩසටහන් 03 ක් නම් කරන්න.

(ල.03)

02. එහි අන්තර්ගත පහත සඳහන් කරුණු පිළිබඳ විස්තරයක් කරන්න.
ගායන හා වාදන
උපකරණ භාවිතය
වාදන භාණ්ඩ
රංග වස්ත්‍රාභරණ

(ල.09)

**පළමු වාර පරීක්ෂණය - 2018**
**නර්තනය - 11- ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 3 | 21. | 2 | 31. | 3 |
| 2. | 4 | 12. | 2 | 22. | 4 | 32. | 1 |
| 3. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 3 |
| 4. | 3 | 14. | 4 | 24. | 1 | 34. | 4 |
| 5. | 1 | 15. | 2 | 25. | 1 | 35. | 3 |
| 6. | 1 | 16. | 1 | 26. | 2 | 36. | 2 |
| 7. | 2 | 17. | 1 | 27. | 1 | 37. | 2 |
| 8. | 4 | 18. | 2 | 28. | 4 | 38. | 3 |
| 9. | 3 | 19. | 4 | 29. | 2 | 39. | 2 |
| 10. | 2 | 20. | 4 | 30. | 2 | 40. | 2 |

**පිළිතුරු පත්‍රය - II**

1). 1. ඇම්බැක්කේ
2. වෙම්බු
3. බලි
4. පොකුරු
5. මකුළුවාගේ
6. ආචාර්ය එස්.පනීභාරත
7. 1943
8. පිරිමින්
9. 1. පොන්තානි 2. වෙන්ඩාව / මද්දලය
10. 1. මහනුවර 2. දඬදෙරණි / කෝට්ටේ

2). 1. අදාල තිත නිවැරදිව දක්වා ඇත්නම් ල.01
බෙරපදය නිවැරදිව බෙර පදය ප්‍රස්ථාර කර ඇත්නම් ල.01

| ^1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 | ^1 | 2 | 3 | 1/ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෝං | - | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොං | - | ත | ක |

2. අදාල තිත් රූපයට අනුව වන්නමක කවි පදයක් ප්‍රස්ථාර කර ඇත්නම් (ල.04)
3.

| ^1 | 2 | 1/ | 2 | 3 | ^1 | 2 | 1/ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| තක් | කඩ | තක් | කඩ | කුද | ත | ක | රොං | - | - |
| ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ද |
| කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| ජි | ක | රොං | | | | | | | |

(ල.06)

3). 1. කප් සිටුවීම, මඩු පේ කිරීම...ආදී ලෙස නම්කර ඇත්නම් (ල.02)
2. අස්නය, කොහොඹා හැල්ල, මඩුපුරය ආදී ලෙස නම් කර ඇත්නම් (ල.02)
විස්තර කර ඇත්නම් (ල.02)
3. අඹ විදමන, මරා ඉපැද්දීම, නානුමුරය, කපුයක්කාරි ආදී නම් කර ඇත්නම් (ල.02)
විස්තර කර ඇත්නම් (ල.04)

4. 1. ස්පිල් බර්ජන්, රොබට් නොක්ස්, ඉබන්බතුතා, පාහියන් භික්ෂුව
(ල.02)
2. <u>ස්පිල් බර්ජන්</u>
"මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්. ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටි කයේ වැඩදැමූ වස්ත්‍ර ඇත්තේය"

★රොබට් නොක්ස්
"එහි දේවාල විහාරවල තේමාව සඳහා නියමු වූ කුලවලින් පැමිණි කළගෙඩි සෙල්ලමේයෙදෙන නළඟනෝ වෙත්"

★ඉබන්බතුතා
දෙවුන්දර උපුල්වන් දේවාලයේ මිනිස් ප්‍රමාණ උස දෙව්රුවක් අභියස පන්සියයක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බවය.

(ල.04)

3. වාර්තාවක් ඇසුරින් නර්තන කලාව පිළිබඳ විමසීමක් කර ඇත්නම්

(ල.06)

5). 1. කථකලි නර්තන සම්ප්‍රදාය නම් කිරීමට හා විග්‍රහ කිරීමට (ල.04)

2. කුහුඹු රාජධානියේ කුහුඹු රජිනගේ අණට අනුව කටයුතු කරන විවිධ කුහුඹු පවුල් වාසය කරයි. දිනක් කුහුඹු පවුල් තම රාජධානියෙන් ඈතට පිටත් වූ අතරතුර මදුරුවෙක් පැමිණ කුහුඹුවන්ගේ නිවාස කඩා බිඳ දමයි. විනාශ වී ගිය රාජ්‍ය නැවත ගොඩ නගා අසල්වැසියන් සඳහා තේ පැන් සංග්‍රහයක් සූදානම් කරයි. සංග්‍රහය පවතින අතර වර්ෂාවක් පැමිණ ප්‍රදේශයම ජලයෙන් යටවෙයි.පියාපත් ඇති අය පියැඹූ අතර කුහුඹුවන් ටින් එකකට නැඟී බලා සිටියදී පණ බේරා ගනු ලබයි. (ල.04)

3. 1934 හොරණ ශ්‍රීපාලි ආයතනයට මුල්ගල තැබීම.

1936 දී සීතාහරණ මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය.

1940 දශකයේ මුද්‍රා නාට්‍ය කලාකරුවන් බිහි වීම.

1948 දී චිත්‍රසේනයන්ගේ රාවණා මුද්‍රා නාට්‍ය සකස් කිරීම.

1950 දී වේදිකා ගත වූ නාට්‍ය සැළලිහිණයෙ දියසේන මුද්‍රා නාට්‍ය

1961 දී ප්‍රථම මුද්‍රා නාට්‍ය උළෙල පැවැත්වීම.
කරදිය මුද්‍රා නාට්‍ය බිහිවීම

(ල.04)

6. 1. මාතෘකා 03 ක් විස්තර කර ඇත්නම් ල.4 x 3)

7. 1. රූපවාහිනී වැඩසටහන් 03 ක් නම් කර ඇත්නම් (ල.03)

2. සඳහන් කර ඇති නිර්ණායක ඔස්සේ විස්තර කර ඇත්නම් (ල.09)